හපුතලේ ප්‍රාදේශීය සභාව - 2022
---------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට හපුතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී වැඩ අවසන් කර තිබුණු රු.2,659,865 න් වටිනා කර්මාන්ත 03ක වටිනාකම ප්‍රාග්ධනීත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ප්‍රාග්ධනීත කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ වලදී කඩා ඉවත් කළ ගොඩනැගිලි 04 ක එකතු වටිනාකම රු.843,841 ක් ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි. | කඩා ඉවත් කළ එම ගොඩනැගිලිවල වටිනාකම් ඉදිරි වර්ෂයේදී ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවියයුතු ණය වාරික සහ පොලී මුදල රු.3,609,161 ක් ලෙස ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණද 2023 වර්ෂයේදී ගෙවීමට නියමිත ණය වාරික හා පොලී මුදල හඳුනාගෙන ජංගම වගකීම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනම දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ජංගම වගකීම්වලට අදාළ ණය මුදල නිවැරදිව ගිණුම් ගත කරන බව. | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ප්‍රාග්ධන ආධාර ශේෂය හා උපලේඛන අනුව ශේෂය අතර රු.997,924 ක වෙනසක් විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 134 (2) වගන්තිය | දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී පිහිටුවීමට නියමිත මහා සභාවට යොමු කර අවශ්‍ය | සෑම දියුණු ප්‍රදේශයකින්ම වරිපනම් බදු අයකර |

| | | | | |
|---|---|---|---|---|
| | | | කටයුතු සිදු කරන බව. | ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ පනතේ 2 ඡේදය | සභිකයින් 16 ක් සමාලෝචිත වර්ෂය සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි | වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දෙන ලෙස සභිකයන් දැනුවත් කරන බව. | වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,993,920 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,059,167 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 1,984,474 | 1,863,874 | 2,333,438 | (469,564) | 1,562,934 | 1,767,070 | 916,541 | 850,529 |
| (ii) | කුලී | 5,451,610 | 4,103,916 | 5,166,888 | (1,062,972) | 2,225,640 | 3,874,454 | 2,338,613 | 1,535,841 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,102,300 | 1,232,590 | 616,934 | 615,656 | 1,154,700 | 916,370 | 915,870 | 500 |
| (iv) | වෙනත් ආදායම් | 13,846,950 | 18,578,895 | 8,130,228 | 10,448,667 | 15,108,200 | 15,206,632 | 10,742,803 | 4,463,829 |
| | එකතුව | 22,385,334 | 25,779,275 | 16,247,488 | 9,531,787 | 20,051,474 | 21,764,526 | 14,913,827 | 6,850,699 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු.25,779,275ක් වූ මුළු ආදායමෙන් වර්ෂය අවසාන වන රු.9,531,787 ක් අය කරගෙන නොතිබූ අතර, එය මුළු බිල් කළ ආදායමෙන් සියයට 36 ක් විය. | මේ වන විට හිඟ ආදායමෙන් වැඩි ප්‍රමාණයක් අයකර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | වසර 02 ක කාලයක සිට පැවත එන කඩ කාමර 14 කින් රු.100,376 ක හිඟ කඩ කාමර කුලිය සහ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කාමර 25 කින් හිඟ කුලී රු.104,550 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ මුදල් ඉදිරියේදී අය කර ගන්නා බව. | හිඟ හිටි ආදායම් කඩිනමින් අය කරගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම් පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය කළමණාකරන වැඩසටහන සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතුය. |

**3.2 අනාර්ථික ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 මැයි 08 දිනැති අංක 2122/29 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් රීති අංක 01 අනුව ප්‍රාදේශීය සභා සභාපතිවරයා සභාවේ වාහනය යොදවා ගන්නේ නම්, මසකට ඉන්ධන ලීටර් 400 කට නොවැඩි ප්‍රමාණයක් සඳහා සභා අරමුදලින් වියදම් දැරිය හැකි වුවද, එයට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා සභාවට අයත් කැබ් රථයක් සඳහා අනුමැතිය ඉක්මවා ඉන්ධන ලීටර් 1597.8 ක් යොදා තිබුණි. | කැබ් රථය ඌව පළාතෙන් බැහැර ධාවනයට පමණක් අනුමැතිය ලබාගෙන ඇති බව. | අනුමත සීමාව තුළ ඉන්ධන භාවිතය සිදු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය අනුව යන්ත්‍ර හා උපකරණ යටතේ රු.37,700 ක් වූ වතුර මෝටර් 03 ක් දක්වා තිබුණද, භෞතික පරීක්ෂාවේදී වතුර මෝටර් 02 ක ඌනතාවයක් පැවතුනි. එම ඌනතාවයක් සම්බන්ධයෙන් පසු විපරම් සිදුකර නොතිබුණි. | පළාත් පාලන දෙපාර්තුමේන්තුවේ උපදෙස් පරිදි කටයුතු කරන බව. | ඌන භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කර අලාභ අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ ලීබඩු හා සවිකිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණු රු.213,610 ක් වූ කොඩි කණු 06 ක්, කාර්යාල කැරකෙන පුටු 19 ක්, පරිගණක පුටු 11 ක් සහ ඇඳි සහිත පුටු 09 ක් භෞතිකව නිරීක්ෂණය නොවුනි. | -එම- | -එම- |

**3.4** **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවට 2013 සිට 2021 කාලය තුල බඳවාගෙන තිබුණු සේවකයින් 11 දෙනෙකුට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබා දී නොතිබුණි. | රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | අනියම්, ආදේශක, තාවකාලික සේවකයන්ට රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකත්වය ලබා දිය යුතුය. |
| (ආ) | ස්ථාන මාරු වී ගිය හා සේවය අතහැර ගිය නිලධාරින්ගේ හිඟ ණය ශේෂ ඇපකරුවන්ගෙන් අය කරගත යුතු වුවද, සේවකයින් 5 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 40,773 හිඟ ණය ශේෂ සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ හිටි සේවක ණය ශේෂ කඩිනමින් අයකරගත යුතුය. |